

# සිංහල

## 4 ශ්‍රේණිය

Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 16 පාඩම

## අතීත කාල ක්‍රියාපදවල මූර්ධජ "ණ "යෙදෙන

### ක්‍රියාකාරකම 1

අවස්ථා සොයමු.

- පහත වාක්‍ය ශබ්දනගා කියවමු.

1. උදෑසනින් කුරුලු නාදය ඇසුණේ ය.
2. ඉදුණු අඹ ගෙඩියක් වැටුණේ ය.
3. නංගී අලුත් ගවුමකින් සැරසුණා ය.
4. අප නිවසට කඳු යායම පෙනුණේ ය.
5. අපි කුඩා කල ගීතවලින් සැනසුණෙමු.

- එහි ඇති අතීත කාල ක්‍රියාපදවල මූර්ධජ 'ණ ' අකුර යෙදී ඇති ආකාරය දෙස හොඳින් බලමු.
- එම වචන ඔබ කැමති පාට පැන්සලකින් කොටු කරමු. ශබ්ද නගා කියවමු.

## ක්‍රියාකාරකම 2

- පෙළපොතේ '**රෙදි වියනා මකුළු දැරිය**' (පිටු අංක 31-36) පාඩම ශබ්ද නඟා කියවමු.
- එහි ඇති මූර්ධජ 'ණ' යෙදුණු අතීතකාල ක්‍රියාපද තෝරා යටින් ඉරක් අඳිමු.
- එම ක්‍රියාපද සහිත වාක්‍ය $A_4$ කොළයක ලියා ගනිමු. එහි ඇති ක්‍රියා පදය රවුම් කරමු.
- දැන් එම ක්‍රියා පද ශබ්ද නඟා කියවමු.

> - **අතීතකාල ක්‍රියාපදවල බොහෝ අවස්ථාවල දී මූර්ධජ 'ණ' අකුර යෙදෙයි.**